--------------------------------------------------------------------------------

# දිවුලපිටිය ප්‍රාදේශීය සභාව

# ගම්පහ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලබේ.

(අ) 2013 ජනවාරි 07 දින ලැබුණු 2011 මැයි සිට අගෝස්තු දක්වා කාලයට අදාළ රු.13,240,352 ක් වූ මුද්දර ආදායම උපචිත සංකල්පය අනුව වර්ෂයේ ආදායමට ගෙන තිබූ නමුත් 2013 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ ලැබී තිබූ රු.30,654,375 ක්වූ මුද්දර ආදායම් එකී සංකල්පය අනුව වර්ෂයේ ආදායමට ගෙන නොතිබුණි.

(ආ) 2007 හා 2009 වර්ෂවල පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ට්‍රැක්ටර්වල වටිනාකම රු.1,269,000 ක් ජර්නල් අංක 01 මගින් ගිණුම්වලට ඇතුළත් කිරීමේදී එකතුව රු.12,690,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා මෝටර් රථ හා කරත්ත ගිණුමේ සහ පරිත්‍යාග ගිණුමේ ශේෂය රු.11,421,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ජර්නල් සටහන් අංක 08 අනුව 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ගිණුම්ගත කිරීමට නොහැකි වූ ඉඩම්වල වටිනාකම ලෙස රු.6,433,370 ක් ප්‍රාග්ධනීත කර තිබුණි. එහෙත් දී ඇති උපලේඛනය අනුව, මෙම කාලය තුළදී ගිණුම්ගත නොකළ ඉඩම්වල වටිනාකම රු.7,709,371 ක් ලෙස දැක්වීම හේතුවෙන් තවදුරටත් ගිණුමට ඇතුළත් නොවූ ඉඩම්වල වටිනාකම රු.1,276,000 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් එකතුව රු.106,983,999 ක් වූ අතර, ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ සහ පරිත්‍යාග ගිණුමේ එකතුව රු.108,522,381 ක් වුයෙන් රු.1,538,382 ක වෙනසක් අනාවරණය විය.

(ඉ) උප කාර්යාලවල ඇති රු.116,551 ක අතැති මුදල සැලකිල්ලට නොගෙන බැංකු සැසඳුම පිළියෙල කර තිබුණි.

(ඊ) බැංකු සැසඳුම පිළියෙල කිරීමේදී ප්‍රා.ස.10 අනුව මුළු ලැබීම් හා ගෙවීම් පදනම් කර නොගෙන බැංකුගත කිරීම් පමණක් සැලකිල්ලට ගෙන බැංකු සැසඳුම් පිළියෙල කර තිබුණි.

(උ) 2011 ජනවාරි 14 දින හා 2011 පෙබරවාරි 08 දින මිලදීගත් විදුලි උපකරණ තොගය පිළිවෙළින් රු. 913,000 ක් හා රු 880,000 ක් ගිණුම්ගත කිරීමේදී පිළිවෙලින් රු 91,300 ක් හා 88,000 ක් වශයෙන් ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම සඳහා අංක 63 දරණ ජර්නල් සටහන මගින් ගිණුමට ඇතුළත් නොවූ ලැබීම් රු 1,613,700 ක් විදුලි තොග ගිණුම හර කර පොදු සැපයුම් ණයගිමි ගිණුම බැර කළ යුතු වවත් එසේ නොකොට පොදු ගබඩා ගිණුම බැර කිරීම නිසා ගබඩා තොගය රු.1,613,700 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලොචිත වර්ෂයේදී නිකුත් කිරීම් නියෝග 16කට අදාළව ගබඩාවෙන් නිකුත් කරන ලද රු.1,315,428 ක්වූ පොදු ගබඩා තොග නිකුත් කිරීම් ලෙස ගිණුමට ඇතුළත් නොවීම නිසා පොදු ගබඩා තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) රු.18,900,000 ක් වටිනා බලගල්ලවත්තේ හෙක්ටයාර් 2.1365 ක ඉඩම පවරා ගැනීම, ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) මග නැගුම ග්‍රාමීය මාර්ග වැඩ සටහන 2012 ට අදාළව 2013 වර්ෂයේදී ප්‍රතිපූර්ණය වූ රු.5,000,000 ක් සහ ව්‍යාපෘති අංක 26152301037 දරන පළාත් සභා ව්‍යාපෘතිය වෙනුවෙන් 2013 වර්ෂයේ ප්‍රතිපුර්ණය වූ රු.300,000 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියෝ ලෙස දක්වා නොතිබුණි.

1.3.2 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.38,009,846 ක්ව ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,560,349 ක් ව අතර, ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.28,824,949 ක් විය.

### 2.2 <u>මූල්‍ය පාලනය.</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මාස 6 ඉක්මවූ උපලබ්ධි නොවූ චෙක්පත් 16 ක එකතු වටිනාකම වූ රු.34,559 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 සැප්තැම්බර් මස ලියන ලද රු.57,167 ක් වටිනා චෙක්පත් 5 ක් අදාළ පාර්ශව වෙත යොමු නොකර 2013 ඔක්තෝබර් 07 විගණිත දින වන විටත් අත රඳවාගෙන තිබුණි.

(ඇ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 14 විධිවිධාන වලට පටහැනිව වැය ශීර්ෂ 05 කට අදාළව රු.3,990,087 ක් ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.

(ඈ) වැය ශීර්ෂ 3 ක ඇස්තමේන්තුගත වියදමට අමතරව අතිරේක මුදල් මාරු කිරීම්ද සිදුකර තිබූ නමුත් ප්‍රතිපාදන ඉක්මවා රු.63,920,669ක් වැය කර තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තු ආදායම් හා තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදයම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 8,819 | 8,871 | 6,243 |
| (ii) | බදු කුලී | 3,044 | 3,808 | 3,721 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 379 | 289 | 131 |
| (iv) | වෙනත් ආදායම් | 75,339 | 78,328 | 131 |

### 2.3.2 වරිපනම් බදු

දිවුලපිටිය උප කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.4,732,338 ක් වන අතර රු.10,000 ට වැඩි ශේෂය රු.3,106,792 කි. මෙම ශේෂය තුළ වසර 05 ත් වසර 22 ත් අතර කාල පරාසයක වූ රු.292,297 ක ශේෂයක් පැවතින. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) ජේදය ප්‍රකාරව මෙම මුදල් අයකර ගැනීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි. වරිපනම් බදු තක්සේරුව වසර 5 න් 5 ට ප්‍රතිශෝධනය කලයුතු වුවත් 2003 වර්ෂයෙන් පසු බදු තක්සේරුවක් සිදුකර නොතිබුණි.

### 2.3.3 අක්කර බදු

දිවුලපිටිය කෙහෙල්ඇල්ල කොටදෙනියාව උප කාර්යාලවල 2012 දෙසැම්බර් 31 දිනට අයවියයුතු අක්කර බදු ශේෂය රු.362,822 ක් විය.

### 2.3.4 කර්මාන්ත බදු

දිවුලපිටිය උප කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත බදු ශේෂය රු.331,290 ක්වූ අතර, එයින් වසර 5 ඉක්මවූ ශේෂය රු.258,625 ක් විය.

### 2.3.5 <u>බදුකුලී</u>

(අ) මරදගහමුල පොදු වෙළඳපල කඩ කාමරවලින් අයවීමට ඇති හිඟ ශේෂය රු.162,452 ක් වූ අතර, මෙය 2000 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයක් වුවත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෙහෙල්ඇල්ල, කොටදෙනියාව, දිවුලපිටිය උප කාර්යාලවල අයවියයුතු බදුකර කුලිය රු.3,302,652 ක් වූ අතර, මෙය වසර 5ට වඩා පැරණි ශේෂයක් විය.

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති 80/46 දරන චක්‍රලේඛය ප්‍රකාර අවම වශයෙන් වසර 5 කට වරක්වත් කඩ කුලිය තක්සේරු කල යුතු වුවද, දිවුලපිටිය ප්‍රාදේශීය සභාවට අයත් කඩ සම්බන්ධව අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2000 වසරේ සිට මරදගහමුල පොදු වෙළඳපොල කඩ කාමර 11 කින් අයවීමට ඇති ශේෂය රු.23,461 ක් ද, දිවුලපිටිය උප කාර්යාලයට අයත් සති පොලෙන් සහ මාළු කඩවලින් අයවීමට ඇති කුලිය රු.468,370 ක් ද වු අතර වසර 5 කට අධික කාලයක් ගතවී ඇතත්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.6 <u>නිවාස කුලී</u>

කොටදෙනියාව උපකාර්යාලයේ, අයවීමට තිබූ නිවාස කුලිය රු.179,013 ක් වන අතර මෙය 2000 වර්ෂයේ සිට ඉදිරියට එමින් පවති.

### 2.4 <u>ඉඩම් අනුබෙදීම</u>

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ පොදු පහසුකම් සඳහා වෙන්කර ඇති පහත සඳහන් ඉඩම් කොටස් වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණ.

| පිඹුරු අංකය | ඉඩමේ නම | ප්‍රමාණය |
|---|---|---|
| 3643 | බලගල්ල ගමේ පිහිටි වෙරළුගහ ගොඩැල්ල නමැති ඉඩම | පර්චස් 36 යි. |
| 4280 | කොටදෙනියාව බර්වින්ටන් වත්ත | පර්චස් 52.74 |

---

510017 හේන්පිටගෙදර දෙල්ගහවත්ත ඉඩම පර්චස් 27

(ආ) 1998 නොවැම්බර් 13 දිනැති අංක 1053/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ අතුරු ව්‍යවස්ථා 5(5) ඡේදය පරිදි අනුබෙදුම් කරන ඉඩමේ පාරවල් සඳහා වෙන්කල බිම් හැර ඉඩමෙන් 8% කට නොඅඩු ප්‍රමාණයක් ප්‍රජා, සේවා හා විනෝද ක්‍රීඩා කටයුතු සඳහා අදාළ අනුබෙදුම් සැලසුමෙන් වෙන්කළ යුතු වුවත් පහත අවස්ථාවලදී ඒ අනුව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(i) පිඹුරු අංක 4146 මීගහවත්ත ඉඩම අක්කර 03 යි පර්චස් 31.70

(ii) පිඹුරු අංක 510017 දෙල්ගහවත්ත ඉඩම හෙක්ටයාර් 1.53110

(iii) පිඹුරු අංක 8553 කුඩුමිරිස්, පින්නලන්ද ඉඩම අක්කර 05 යි රූඩ් 05 පර්චස් 22.5

(ඇ) ඉහත සඳහන් නියෝග ප්‍රකාරව වීථි අත්හැරීමෙන් පසු භූමි ප්‍රමාණයෙන් 8% කට නොඅඩු ප්‍රමාණයක් ප්‍රජා සහ විනෝද කටයුතු සඳහා වෙන්කළ යුතු වුවත් නියමිත ප්‍රමාණයට අඩුවෙන් වෙන්කර ඇති අවස්ථා 3 ක් නිරීක්ෂණය විය. ඒ අනුව පර්චස් 68.47 ක් සභාවට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) ඉහත සඳහන් ගැසට් නිවේදනයේ 5(9) ඡේදය අනුව අනුබෙදුම් සැලසුම් අනුමත කිරීමෙන් පසුව හා බිම් කට්ටි විකිණීමට පෙර ප්‍රජා සේවා හා විනෝද ක්‍රීඩා කටයුතු සඳහා වෙන්කළ ඉඩම් කොටස කිසිදු ගාස්තුවකින් තොරව අයදුම්කරු විසින් සභාව වෙත නොතාරිස් ඔප්පුවකින් පවරාදියයුතු බව දැක්වෙතත් ඒ අනුව ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පහත සඳහන් ඉඩම් සම්බන්ධයෙන් පොදු පහසුකම් සඳහා ඉඩකඩ වෙන්කර ඇති බවක් අදාළ ලේඛනය අනුව නිරීක්ෂණය නොවූ අතර, එම ලිපි ගොනු විගණනයට ඉදිරිපත් නොවීය.

| ඉඩමේ නම | ඉඩමේ ප්‍රමාණය |
|---|---|
| කුඩුමිරිස්, පින්නලන්ද (8553) | අක්කර 05, රූඩ්05,පර්.22.5 |
| මීගහවත්ත ඉඩම | අක්කර 03 යි පර්චස් 31.70 |

(ඊ) ඉඩම් අනුකොටස් බෙදීම සම්බන්ධව අනුමැතිය දීමේදී සැලසුම් කමිටුවට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) කොටදෙණියාව බර්වින්ටන්වත්ත ඉඩමෙන් පොදු පහසුකම් වෙන්කිරීමේදී ලොට් අංක 58 සහ ලොට් අංක 13 වශයෙන් ස්ථාන දෙකකින් පොදු පහසුකම් සඳහා පිළිවෙලින් පර්චස් 14.79 හා පර්චස් 39.93 ක් වශයෙන් ඉඩකඩ වෙන්කර තිබීම විගණනයේදී මතභේදයට ලක්විය. මෙම ඉඩම්

කොටස් කිසිදු ප්‍රජා කටයුත්තකට යොදාගැනීමට කටයුතු කර නොතිබූ බවත්, සභාව සතු ඉඩමක් බවට නාමපුවරුවක් සවිකර නොතිබූ බවත් භෞතික පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.

(ඌ) ඉහත සඳහන් ගැසට් නිවේදනයේ 06 (එ), (ඒ) සහ (ඕ) යන ජේද ප්‍රකාරව අනුබෙදුම් කිරීමට යෝජිත ඉඩමට නල ජල පහසුකම් නොමැති නම් පානීය ජලය ලබාගතහැකි බවට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ලිඛිත නිර්දේශයද අනුබෙදුම් කරන ඉඩම නේවාසික කටයුතු සඳහා සුදුසු බවට ප්‍රදේශය භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ නිර්දේශයද, ඉඩමට විදුලිබලය සපයා නැති අවස්ථාවක විදුලිය සපයන බවට විදුලි බල මණ්ඩලයෙන් සහතිකයක් ද ලබාගතයුතු වුවත්, ඒ අනුව අදාළ සහතික ලබා ගැනීමකින් තොරව කොන්දේසිවලට යටත්ව සභාපතිවරයා විසින් අනුමත කර තිබුණි.

(එ) බලගල්ලවත්ත වෙරළුගහ ගොඩැල්ල ඉඩමේ පොදු පහසුකම් සඳහා ලොට් අංක 55 (පර්චස් 36 ක්) වෙන්කර ඇතත් පිඹුරු අංක 3643 දරන අනුබෙදුම් සැලැස්මෙහි එම වෙන්කිරීම සඳහන් කර නොතිබුණි.

(ඒ) බලගල්ලවත්ත වෙරළුගහගොඩැල්ල නමැති ඉඩම 2013 ඔක්තෝබර් 24 දින භෞතික පරීක්ෂාවට ලක් කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අදාළ ඉඩම සඳහා විදුලිය පහසුකම් ලබාදී නොතිබුණි.

(ii) පොදු පහසුකම් සඳහා වෙන්කරන ලද කොටසේ මාතෘ සායන සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර, ඒ සඳහා තාවකාලික විදුලි රැහැනක් මගින් විදුලිය ලබාදී තිබුණි.

(iii) ඉඩම සඳහා ජල සම්පාදනයක් සිදුකර නොතිබූ අතර, මාතෘ සායන ගොඩනැගිල්ල සඳහා ළිං ජලය ලබාදී තිබුණි.

(iv) මෙම අනුබෙදුම් සැලසුම 2011 දෙසැම්බර් මාසයේදී කොන්දේසිවලට යටත්ව අනුමැතිය දී ඇතත්, 2013 ඔක්තෝබර් 24 දින වන විටත් ඉඩම සඳහා විදුලිය ජලය ලබා ගැනීම සිදු කර නොතිබුණි.

2.5 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා.</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 වාර්ෂික අයවැය ලේඛනය අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිත එකතුව රු.24,000,000 ක් වටිනා විෂයයන් 3 ක් ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) 2012 සිවිටන කාර්තුවට අදාළ 12% එකතු කළ අගය මත බදු රු.182,469 ක මුදල විගණන දිනය වූ 2013 ඔක්තෝබර් 07 දින වන විටත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ලැබී තිබූ රු.91,957 ක්වූ මුද්දර බදු, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා නොතිබුණි.

3. **<u>පද්ධති හා පාලන.</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.
(ආ) මූල්‍ය පාලනය.
(ඇ) අභ්‍යන්තර විගණනය.
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) තොග පාලනය.
(ඊ) වත්කම් කළමනාකරණය.